# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි: 03/2019

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2019.07.26

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**ආයතන සඳහා අභ්‍යන්තර විගණකවරුන් පත් කිරීම**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වන වගන්තියේ අවශ්‍යතාවය අනුව සෑම විගණන ආයතනයකටම අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමේ අවශ්‍යතාවය, සමහර ආයතනවල ඇති වැඩ ප්‍රමාණය සහ එවැනි පත්වීම් සඳහා වන පිරිවැය ආදිය ද සලකා බැලීමෙන් අනතුරුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2019 ජුනි 06 දින පැවති සිය 1011 වැනි සභාවාරයේ දී, එහි 996 වැනි සභාවාරයේ දී ගත් තීරණය මත 2019.01.10 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 01/2019 නිකුත් කිරීම සනාථ කරන ලදී. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීමට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී.

I. විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සමඟ ශක්තිමත් කළ යුතු අතර මණ්ඩප/ආයතන විගණනය කළ යුත්තේ එම මණ්ඩප/ආයතනය අනුයුක්ත කර ඇති විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසිනි.

II. මණ්ඩපයේ/ආයතනයේ විගණන කමිටුව විසින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සකස් කරන ලද විගණන වැඩසටහන, සමාලෝචනය කළ යුතු අතර,ඊළඟ වසරේ සමස්ත විගණන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා එම ආයතනය අනුයුක්ත කර ඇති විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ ධාරිතාව ප්‍රමාණවත් නොවේ නම්, සුදුසුකම් ලත් විගණකවරයෙකුගේ (බාහිර විගණක) සේවය ලබා ගැනීමට පාලක මණ්ඩලයට නිර්දේශ කල යුතුය.

III. ආයතනයේ විගණන කමිටුව විසින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ ධාරිතාව සලකා බැලිය යුතු අතර විගණන වැඩසටහනේ වැඩ කොටස්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය හා පත් කරන ලද බාහිර විගණක අතර පැවරීම කල යුතුය.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ. මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් :

1. ලේකම්/ නගර සැලසුම්,ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්

5. ලේකම් /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. විශ්වවිද්‍යාල / මණ්ඩප / ආයතනවල පුස්තකාලයාධිපතිවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් /සහකාර ලේඛකාධිකාරීවරුන්
13. මණ්ඩප /ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
14. විශ්වවිද්‍යාලවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
15. විගණකාධිපති
16. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
17. වෘත්තීය සමිති ලේකම්වරුන්

ලිපි ගොනු අංක: යූජීසී/ සීඅයිඒ/ එෆ්/ අයිඒ චක්‍ර./1